# අතුරුදහන් වූවන් පිළිබඳව වූ කාර්යාලයක් පිහිටුවීම සඳහා වූ පනත් කෙටුම්පත පිළිබඳව කෙටි මාර්ගෝපදේශයක්

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

ජූලි 2016

## හැඳින්වීම

දශක ගණනාවක් තිස්සේ සිදු වූ බලහත්කාරයෙන් සහ සිය කැමැත්ත නොමැතිව සිදු කරනු ලැබූ අතුරුදහන් කිරීමේ සිද්ධි සැලකිය යුතු ප්‍රමාණයක් ශ්‍රී ලංකාවේ පවතී. අතුරුදහන් වූවන් දහස් ගණනක් සම්බන්ධව දිගට ම පවතින ගැටලුවට ප්‍රතිචාරයන් ලෙස කලින් කළ බලයට පත් වූ රජයයන් විසින් විමර්ශන කොමිෂන් සභා කිහිපයක් ඇතුළු නිල පරීක්ෂණ සහ විමර්ශන දියත් කරනු ලැබීය. එකකට පසු තවත් එකක් වශයෙන් විමර්ශන කොමිෂන් සභා මාලාවක් පිහිටුවනු ලැබුවත් බොහොමයක් ශ්‍රී ලාංකිකයෝ තවමත් අතීතයේ සිදු වූ බරපතල නීති උල්ලංඝනයන් සම්බන්ධයෙන් සත්‍යය සහ යුක්තිය සෙවීමේ යෙදී සිටිති. 2015 දී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය විසින් සම්මත කරගනු ලැබූ 'ශ්‍රී ලංකාවේ ප්‍රතිසන්ධානය, වගවීම සහ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම' යන මැයෙන් වූ එකඟතා යෝජනා සම්මතය මගින් ශ්‍රී ලංකාවේ සංක්‍රාන්තික යුක්තියට කාර්ය රාමුවක් ලබා දී තිබේ. එහි එක් පොරොන්දුවක් වන්නේ අතුරුදහන් වූවන් පිළිබඳව වු කාර්යාලයක් පිහිටුවීමයි.

අතුරුදහන් වූවන් පිළිබඳව වූ කාර්යාලය පිහිටුවීම සඳහා වන පනත් කෙටුම්පත ශ්‍රී ලංකා රජය විසින් 2016 මැයි 22 වනදා හඳුන්වා දෙනු ලැබූ අතර එම පනත් කෙටුම්පත මැයි 27 වනදා ගැසට් පත්‍රයේ පළ විය. මෙම පනත් කෙටුම්පත මගින් අතුරුදහන් වූවන් පිළිබඳව වූ කාර්යාලයට ලබා දී ඇති බලතල පිළිබඳව මෙම මාර්ගෝපදේශයෙහි කෙටියෙන් සාකච්ඡා කෙරේ. ස්වාධීන සහ ස්ථිර ආයතනයක් මගින් අතුරුදහන් වූවන් සම්බන්ධයෙන් දැනට ඇති සිද්ධි සමුදයට විසඳුම් ලබා දීමක් වශයෙන් මෙම පනත් කෙටුම්පත හඳුන්වා දීම වැදගත් ඉදිරි පියවරකි. අතුරුදහන් වූවන් පිළිබඳව වූ කාර්යාලය පිහිටුවීම සම්බන්ධයෙන් පවතින ඉදිරි පියවර බෙහෙවින් වැදගත් ය. පනත් කෙටුම්පත මේ වන විට පාර්ලිමේන්තුවට යොමු කර ඇති අතර, සත්‍යය සහ යුක්තිය ඉටු කරන ලෙස ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින වින්දිතයන් කරන ඉල්ලීම් ඉටු කිරීමට හැකි අයුරින් ව්‍යවස්ථාදායකය විසින් අතුරුදහන් වූවන් පිළිබඳව වූ කාර්යාලයෙහි විධිනියෝගය සවිමත් කිරීම අත්‍යවශ්‍ය වේ. නීතියක් ලෙස සම්මත වීමෙන් පසුවකිසිදු ප්‍රමාදයකින් තොරව එය සම්පූර්ණයෙන් ක්‍රියාවට නැංවීමත්, ස්වාධීන සහ අත්දැකීම් සහිත පුද්ගලයන් පත් කිරීමත්, එය ඵලදායි ලෙස ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය සම්පත් සහ සහය ලබා දීමත් අත්‍යවශ්‍ය වේ.

අතුරුදහන් වූවන් සම්බන්ධ ගැටලුව සහ ඒ ආශ්‍රිත ගැටලු සම්බන්ධයෙන් රජය විසින් දියත් කළ වැඩසටහන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් අධීක්ෂණය කර ඇති අතර ඒවා සමග සම්බන්ධ වී කටයුතු කර තිබේ. ඒ අනුව සංක්‍රාන්තික යුක්තිය සඳහා රජයේ පොරොන්දු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අගය කරයි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මෙම කෙටි මාර්ගෝපදේශකය ඉදිරිපත් කෙරෙනුයේ අතුරුදහන් වූවන් සඳහා වූ කාර්යාලයෙහි විධිනියෝගය සහ ඒ හා සම්බන්ධ කරුණු පිළිබඳව දැනුවත් කිරීම සඳහා මෙන් ම, අතුරුදහන් වූවන් පිළිබඳව වූ කාර්යාලය පිළිබඳව එහි පරදු පාර්ශවයන් දැනුවත් වන බවට සහ සත්‍යය යුක්තිය හානි පූරණය සහ නැවත සිදුවීම වැළැක්වීම සාක්ෂාත් කර ගැනීමෙහි ලා අදාළ පරදු පාර්ශවයන් එම ක්‍රියාවලිය සමග සම්බන්ධ වන බවට සහතික කරගැනීම සඳහා ය.

**අතුරුදහන් වූ පුද්ගලයෙකු පිළිබඳ නිර්වචනය (27 වන වගන්තිය)**

කිසියම් පුද්ගලයෙකුගේ ඉරණම හෝ ආගිය අතක් පිළිබඳව නොදන්නා බවට (unknown)සහ සඳහනක් නොමැති බවට (unaccounted for)සාධාරණ විශ්වාසයක් ඇත්නම් සහ නිශ්චිත සන්දර්භයන් තුනකින් එකක් යටතේ ඔහු අතුරුදහන් වී ඇත්නම් එම පුද්ගලයා අතුරුදහන් වූ පුද්ගලයෙකු ලෙස නිර්වචනය කර ඇත.එම සන්දර්භයන් තුන වන්නේ:

1. උතුරු සහ නැගෙනහිර පළාත්වල පැවති සන්නද්ධ ගැටුම හෝ එහි ඵලවිපාක (aftermath)හෝ අදාළ පුද්ගලයා "යුද්ධයේ දී අතුරුදහන් වූවෙකු" ලෙස හඳුනාගත් සන්නද්ධ හමුදාවල හෝ පොලීසියේ සාමාජිකයෙකු නම්;

2. දේශපාලන නොසන්සුන් බව හෝ සිවිල් කෝලාහල; හෝ

3. බලහත්කාරයෙන් සිදු කරන අතුරුදහන්වීම්වලින් සියලු දෙනාට ම ආරක්ෂාව ලැබීම සඳහා වනජාත්‍යන්තර ප්‍රඥප්තියෙන් නිර්වචනය කර ඇති බලහත්කාරයෙන් සිදු කරනු ලැබූ අතුරුදහන් කිරීමක්.

**විධිනියෝගය (mandate) (10 වන වගන්තිය)**

පනත් කෙටුම්පතෙහි 10 වන වගන්තියෙහි දක්වෙන පරිදි අතුරුදහන් වූවන් පිළිබඳ වූ කාර්යාලයට පුළුල් විධිනියෝගයක් හිමි වී ඇත. මූලික විධිනියෝගය ලෙස පෙනී යන්නේ අතුරුදහන් වූවන් පිළිබඳ සෝදිසි කිරීම (search)සහ පවතින තොරතුරු මත ඔවුන් සොයා යාම (tracing), ඒ සඳහා සුදුසු යාන්ත්‍රණයන් හඳුනාගැනීම සහ එම පුද්ගලයන් අතුරුදහන් වූ වාතාවරණය පැහැදිලි කර ගැනීමයි. අතුරුදහන් වූවන් පිළිබඳ සිද්ධි විසඳීම සඳහා අදාළ ආයතනවලට නිර්දේශ ලබා දීම, අතුරුදහන් වූවන්ගේ සහ ඔවුන්ගේ ඥාතීන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම, අතුරුදහන් වූවන්ට සහ ඔවුන්ගේ ඥාතීන්ටසහන ලැබිය හැකි මාර්ග හඳුනා ගැනීම සහ ඔවුන්ට ඒ බව දැනුම් දීම සහ අතුරුදහන් වූවන් පිළිබඳව මීට පෙර වෙනත් ආයතන විසින් ක්‍රියාත්මක කළ ක්‍රියාවලීන් ඔස්සේ ලැබුණු දත්ත එකට එකතු කර මධ්‍යගත දත්ත ගබඩාවක් පිහිටුවීම අතුරුදහන් වූවන් පිළිබඳ වූ කාර්යාලයෙහි විධිනියෝගයේ සෙසු කරුණුවලට ඇතුළත් වේ. මීට පෙර පැවති යාන්ත්‍රණ මෙන් නොව අතුරුදහන් වූවන් පිළිබඳ වූ කාර්යාලයෙහි විධිනියෝගය මගින් කිසියම් පුද්ගලයෙකු අතුරුදහන් වූවෙකු බවට පත් වූ කාල වකවානුව නොසලකා අතුරුදහන් වූ පුද්ගලයන් සියලු දෙනා ම ආවරණය කරයි.

**අතුරුදහන් වූවන් පිළිබඳ වූ කාර්යාලයෙහි බලතල (11 සහ 12 වන වගන්ති)**

11 සහ 12 වන වගන්ති මගින් අතුරුදහන් වූවන් පිළිබඳ වූ කාර්යාලයට ලබා දී ඇති බලතල හඳුන්වා දේ. අතුරුදහන් වූවන් පිළිබඳ වූ කාර්යාලය විසින් සිය බලතල පාවිච්චි කිරීමේ දී 14 වන වගන්තියෙහි දක්වෙන පරිදි අතුරුදහන් වූ පුද්ගලයාගේ සහ ඔවුන්ගේ ඥාතීන්ගේ අයිතිවාසිකම් සහතික කිරීමෙහි ලා සමානාත්මතාවෙහි සහ වෙනස් කර නොසැලකීමේ වැදගත්කම නැවත නැවතත් අවධාරණය කළ යුතුය. තව ද, තමන්ට ඵලදායී ලෙස ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය රීති සකසා ගැනීමට අතුරුදහන් වූවන් පිළිබඳ වූ කාර්යාලයට බලය තිබේ. එම රීති මාස තුනක් ඇතුළත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු අතර (ගැසට් පත්‍රයෙහි පළ කිරීම මගින්) ප්‍රසිද්ධියට පත් කළ යුතු ය (26 වන වගන්තිය).

**විමර්ශනය කිරීමේ බලතල (12 වන වගන්තිය):**

- අතුරුදහන් වූවෙකුගේ ඕනෑම ඥාතියෙකු හෝ වෙනත් ඕනෑ ම පුද්ගලයෙකු හෝ සංවිධානයක් විසින් අතුරුදහන් වූ පුද්ගලයන් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන පැමිණිලි භාර ගැනීම.

- පැමිණිල්ලක් හෝ පෙර පැවති කොමිෂන් සභාවකින් ලද තොරතුරු මත අතුරුදහන් වීමක් සම්බන්ධයෙන් පරීක්ෂණයක් හෝ විමර්ශනයක් ඇරඹීම. පොදු වැදගත්කමක් ඇති හෝ වඩා මෑතක දී සිදු වූ හෝ සැලකිය යුතු සාක්ෂි දැනටමත් පවතින සිද්ධිවලට ප්‍රමුඛත්වය ලබා දෙනු ඇත.

- රහස්‍යභාවය ඉතා ඉහළින් ආරක්ෂා කරගනිමින් ලිඛිත, වාචික හෝ වීඩියෝ සාකච්ඡා පහසුකම යටතේ හෝ කැමරා මගින් ප්‍රකාශ ලබා ගැනීම සහ භාර ගැනීම මගින් සිද්ධි පිළිබඳව ඵලදායී ලෙස විමර්ශනය කිරීමට අවශ්‍ය පියවර ගැනීම. ලැබෙන තොරතුරුවල රහස්‍යභාවය පිළිබඳව වග බලා ගැනීමටඅතුරුදහන් වූවන් සඳහා වූ කාර්යාලයට වගකීමක් ඇත. මෑතක දී සම්මත වූ තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය පිළිබඳ පනත අතුරුදහන් වූවන් සඳහා වූ කාර්යාලයට අදාළ නොවේ (25 වන වගන්තිය).

- ප්‍රකාශයක් ලබා දීම සඳහා හෝ තමන් සන්තකයේ ඇති ලේඛනයක් ඉදිරිපත් කිරීම සඳහා හෝ ඕනෑ ම පුද්ගලයෙකු අතුරුදහන් වූවන් සඳහා වූ කාර්යාලය ඉදිරියට කැඳවීමේ බලය.

- සොහොන් බිමක් ලෙස සැක කෙරෙන ස්ථානයක් හෑරීම සහ/හෝ මළ සිරුරක් ගොඩ ගැනීම සඳහා ප්‍රාදේශීය අධිකරණ බලය ඇති සුදුසු මහේස්ත්‍රාත් අධිකරණයට ඉල්ලීමක් කිරීම සහ එවැනි ක්‍රියාවලියක දී නිරීක්ෂකයෙකු ලෙස ක්‍රියා කිරීමේ හැකියාව.

- එහි විධිනියෝගය ඉටු කර ගැනීම සඳහා ඕනෑම රජයේ හෝ පළාත් පාලන ආයතනයකින් හෝ නියෝජිතයෙකුගෙන් අවශ්‍ය සහය ඉල්ලා සිටීම.

- රඳවා තබාගෙන සිටින ස්ථානවලට වරෙන්තුවක් නොමැතිව ඇතුළු වී විමර්ශනය කිරීමට හෝ සැකසහිත පරිශ්‍රය පොලීසිය විසින් සෝදිසි කිරීමට හැකි වන පරිදි සෝදිසි වරෙන්තුවක් නිකුත් කරන ලෙස මහෙස්ත්‍රාත්වරයාට ඉල්ලීමක් කිරීමට සහ අතුරුදහන් වූවන් සඳහා වූ කාර්යාලය විසින් සිදු කෙරෙන විමර්ශන සඳහා අවශ්‍ය සාක්ෂි ලබා ගැනීමට අතුරුදහන් වූවන් සඳහා වූ කාර්යාලයේ නිලධාරියෙකුට බලය ලබා දේ.

- අතුරුදහන් වූවන් සඳහා වූ කාර්යාලයේ විධිනියෝගයට අයත් නොවන සිද්ධි පොලීසියට හෝ නීතිය බලාත්මක කිරීමේ අදාළ ආයතනයට යොමු කිරීම.

- විමර්ශනයක් අවශ්‍ය වන ආකාරයේ වරදක් සිදු කර ඇත්නම් අතුරුදහන් වූ පුද්ගලයෙකු පිළිබඳ තොරතුරු සහිත වාර්තා භාර දීම.සාක්ෂිකරුවෙකු කැමැත්ත පළ කළහොත් විමර්ශන ක්‍රියාවලියේ දී භාවිත කිරීම සඳහා අදාළ ආයතනය විසින් එම සාක්ෂිකරුගෙන් ප්‍රකාශයක් ලබා ගැනීම සඳහා අතුරුදහන් වූවන් සඳහා වූ කාර්යාලය විසින් එම සාක්ෂිකරුගේ තොරතුරු ද අදාළ ආයතනයට දැනුම් දිය හැකි ය.

**සාමාන්‍ය බලතල (11 වන වගන්තිය):**

- දේශීය වශයෙන් හෝ විදේශීය හෝ කිසියම් පුද්ගලයෙකු හෝ සංවිධානයක් සමග තොරතුරු ලබා ගැනීම සඳහා අවශ්‍ය ගිවිසුම් ඇතුළු ගිවිසුම්වලට ඇතුළු වීම; තොරතුරුවල රහස්‍යභාවය රැකීම; තාක්ෂණික සහය ලබා ගැනීම; පුහුණුව සහ සහයෝගීත්වය; සහ දත්ත ගබඩා පිහිටුවීම.

- අතුරුදහන් වූවන් පිළිබඳ වූ කාර්යාලයේ රැස්වීම්වලට අදාළබලතල, වගකීම්, කාර්යය සහ රීති පාවිච්චි කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සම්බන්ධව අතුරුදහන් වූවන් පිළිබඳ වූ කාර්යාලයේ සියලු ම සේවකයන් විසින් පිළිපැදිය යුතු රීති පැනවීමේ බලය.

- සේවකයන් සහ උපදේශකයන් පත් කිරීම සහ ඉවත් කිරීම සහ අතුරුදහන් වූවන් පිළිබඳ වූ කාර්යාලය සඳහා රජයේ සේවකයන් අනුයුක්ත කරන ලෙස ඉල්ලීම් කිරීම.

- කාර්යලය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සහ මෙහෙයවීම සඳහා අවශ්‍ය කමිටු, ඒකක සහ අංශ පිහිටුවීම.

**අතුරුදහන් වූවන් පිළිබඳ වූ කාර්යාලයෙහි කාර්යය සහ වගකීම් (13 වන වගන්තිය)**

- විමර්ශනවලට බාධාවක් නොවන්නේ නම් පමණක් සිදු වෙමින් පවතින විමර්ශනයක් පිළිබඳව පවුලේ අයට තත්ත්ව වාර්තාවක් ලබා දීම.
- අතුරුදහන් වූ පුද්ගලයා ජීවත්ව සිටින බව සොයා ගනු ලැබුවහොත් ඔහුගේ කැමැත්ත ඇතිව ඔහු පිළිබඳ තොරතුරු ඔහුගේ ඥාතියෙකුට හෝ වෙනත් පැමිණිළි කරුවෙකුට හෙළි කිරීම.
- විමර්ශනයක් අවසන් වීමෙන් පසුවඅතුරුදහන් වූ පුද්ගලයාගේ ඉරණම සහ ඔහු අතුරුදහන් වූ වාතාවරණයපිළිබඳවඅතුරුදහන් වූවන් සඳහා වූ කාර්යාලය විසින් ඔහුගේ ඥාතීන්ට දැනුම් දිය යුතු ය.
- අතුරුදහන් වූ පුද්ගලයෙකු පිළිබඳව විමර්ශනයක් පවත්වා (අතුරු සහ අවසන්) වාර්තාවක් නිකුත් කිරීම. එවිට දක්නට නොමැති බව පිළිබඳ සහතික (Certificate of Absence)හෝ මරණ සහතිකයක් නිකුත් කිරීමට රෙජිස්ට්‍රාර් ජෙනරල්වරයාට හැකි වේ.
- අතුරුදහන් වූ පුද්ගලයාගේ ඥාතීන්ට පරිපාලනමය සහ සුබසාධන සේවා ලබා දීම.
- අදාළ ආයතනය විසින් අතුරුදහන් වූ පුද්ගලයාට සහ/හෝ ඔහුගේ ඥාතීන්ට හානි පූරණ ලබා දෙන ලෙසට නිර්දේශ කිරීම.
- අතුරුදහන් වූවන් සඳහා වූ කාර්යාලයට පැමිණෙන වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව සඳහා ක්‍රමවේදයක් ඇති කිරීම.
- අතුරුදහන් වූවන් සම්බන්ධයෙන් දත්ත ගබඩාවක් නිර්මාණය කර එය කළමනාකරණය කිරීම සහ පවත්වාගෙන යාම.
- අතුරුදහන් වූවන් සම්බන්ධ හේතු, සිද්ධි සහ ප්‍රතිඵල පිළිබඳව මහජනයා දැනුවත් කිරීමට පියවර ගැනීම මෙන් ම අතුරුදහන් වූවන්ගේ ඥාතීන්ට සහයෝගය ලබා දීම සහ ඔවුන්ට නෛතික, මනෝ-සමාජීය සහ පරිපාලනමය සහය සඳහා ප්‍රවේශ වීමට පහසුකම් සැලසීම සඳහා පියවර ගැනීම.
- පහත කරුණු සම්බන්ධයෙන් අදාළ ආයතනවලට නිර්දේශ ලබා දීම: නැවත එවැනි අතුරුදහන් වීම් සිදුවීම වැළැක්වීම, අතුරුදහන් වූ පුද්ගලයන් අනුස්මරණය සහ ඔවුන්ට කෘතඥතාව පළ කරන ක්‍රම, අතුරුදහන් වූ පුද්ගලයෙකුට අදාළ තොරතුරු පළ කිරීම, අදාළ නීති සහ රෙගුලාසි වැඩි දියුණු කිරීම, හානි පූරණය, සහ හඳුනාගත නොහැකි සහ හඳුනාගත හැකි ශරීර කොටස් සම්බන්ධයෙන් කටයුතු කිරීම. අතුරුදහන් වූවන් සඳහා වූ කාර්යාලයෙන් සිදු කෙරෙන විමර්ශන මගින් සොයාගනු ලබන කරුණු මගින් අපරාධ හෝ සිවිල් වගකීමක් පැන නොනගී.
- එවැනි නිර්දේශ ඉදිරිපත් කරන විට සුදුසු යැයි හැඟෙන පරිදි අතුරුදහන් වූවන්ගේ ඥාතීන් සහ/ හෝ අතුරුදහන් වූවන් නියෝජනය කරන ආයතන සමග සාකච්ඡා කිරීම.

**අතුරුදහන් වූවන්**
**පිළිබඳව වූ කාර්යාලය**

**(4 වන වගන්තිය)**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කිරීමට නියමිතය. අතුරුදහන් වූවන් පිළිබඳව වූ කාර්යාලය **සාමාජිකයන් 7 දෙනෙකුගෙන්** සමන්විත වන අතර ඉන් එක් අයෙක් එහි සභාපතිවරයා ලෙස පත් කෙරෙනු ඇත. කාර්යාලයෙහි සාමාජිකයන්ට පහත කරුණු ඇතුළත්ව එහෙත් ඒවාට සීමා නොවන පරිදි මානුෂීය ක්ෂේත්‍රයෙහි පූර්ව අත්දැකීම් පුළුල් වශයෙන් තිබිය යුතු යː ජාත්‍යන්තර මානුෂීය නීතිය, මානව හිමිකම් නීතිය, අතුරුදහන් වූවන් පිළිබඳව කාර්යාලයක් පිහිටුවීම සඳහා වූ පනත් කෙටුම්පතෙහි සඳහන් වන පරිදි මානුෂීය ප්‍රතිචාර සහ විමර්ශන/ කරුණු සෙවීම. සාමාජිකයන් වසර තුනකට සිය ධුරය දරන අතර උපරිම වශයෙන් ධුර කාල දෙකක් සේවය කළ හැකි ය. කාර්යාලයේ ප්‍රධාන කාර්යාලය කොළඹ පිහිටවනු ලබන අතර අවශ්‍ය නම් ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීමේ අභිමතය අතුරුදහන් වූවන් පිළිබඳව වූ කාර්යාලය සතු ය.

**ලේකම් කාර්යාලය**
**(16 වන වගන්තිය)**

අතුරුදහන් වූවන් පිළිබඳව වූ කාර්යාලයෙහි කටයුතු පිළිබඳ වගකීම් දරන ලේකම් කාර්යාලයක් පිහිටුවනු ඇත; එම වගකීම් නම්, අතුරුදහන් වූවන් පිළිබඳ වූ කාර්යාලයෙහි වගකීම් සහ කාර්යයන් භාර ගැනීම සහ පනත් කෙටුම්පතෙහි 11 සිට 13 වන වගන්තිය දක්වා වගන්තිවලින් කාර්යාලයට ලබා දී ඇති බලතල ක්‍රියාත්මක කිරීමයි. තව ද, අතුරුදහන් වූවන් සඳහා වූ කාර්යාලයෙහි සියලු ම පරිපාලන කටයුතු ලේකම් කාර්යාලය මගින් සිදු කෙරෙනු ඇත. අතුරුදහන් වූවන් පිළිබඳ වූ කාර්යාලයෙහි කටයුතුවලට සහය වීම සඳහා එහි විශේෂ ඒකක සහ අංශ පිහිටුවනු ඇත. ඉන් ඒකක දෙකක් පනත් කෙටුම්පතෙහි ම නම් කර ඇති අතර සෙසු ඒකක සහ අංශ අනාගතයේ දී පත් කිරීමේ අභිමතය ලබා දී ඇත.

**සෙවුම් ඒකකය**
**(17 වන වගන්තිය)**

අතුරුදහන් වූවන් පිළිබඳව පවතින තොරතුරු මත ඔවුන් සොයා යාම සහ සෝදිසි කිරීම මෙම ඒකකයේ වගකීමයි. එහි කාර්යයන් සිදු කරගෙන යාම සඳහා "අදළ තාක්ෂණික සහ අධිකරණ වෛද්‍ය විද්‍යා විශේෂඥතාව ඇතුළු හැකියාව සහ අත්දැකීම් ඇති, සුදුසුකම්ලත් විමර්ශකයන්" ඇතුළත් විය යුතු ය.

**වින්දිතයන් සහ**
**සාක්ෂිකරුවන් සුරැකීමේ**
**අංශය (18 වන වගන්තිය)**

අතුරුදහන් වූවන් සඳහා වූ කාර්යාලයට සම්බන්ධ වන වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ගේ සුබසාධනය සහ ආරක්ෂාව සහතික වන බවට වගබලා ගැනීම සඳහා " සුදුසු සියලු පියවර" ගැනීමේ වගකීම මෙම අංශයට පැවරෙනු ඇත. එසේ ම අවශ්‍ය අවස්ථාවල අදළ නීති ක්‍රියාත්මක කිරීමේ ආයතන සමග සම්බන්ධීකරණයකින් යුතුව කටයුතු කරනු ඇත.

**මූල්‍ය (19 වන වගන්තිය)**

අතුරුදහන් වූවන් පිළිබඳව වූ කාර්යාලයට සිය විධිනියෝගය ඉටු කර ගැනීම සඳහා ඒකාබද්ධ අරමුදලෙන් අරමුදල් ලබාගත හැකි අතර තමන් විසින් ම අරමුදල් රැස් කර ගැනීමට ද හැකි ය. අතුරුදහන් වූවන් පිළිබඳව වූ කාර්යාලය විසින් පාර්ලිමේන්තුවට වාර්ෂික වාර්තා ඉදිරිපත් කළ යුතු අතර එම වාර්තා මහජනතාවට ලබාගත හැකි අයුරින් ප්‍රකාශයට පත්කළ යුතු ය. අතුරුදහන් වූවන් පිළිබඳව වූ කාර්යාලයෙහි ගිණුම් විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් විගණනය කරනු ඇත.

**අපහාස කිරීමේ වරදක් සිදු වීම (24 වන වගන්තිය)**

24 වන වගන්තියෙහි නිශ්චිතව දක්වා ඇති අවස්ථාවල දී අතුරුදහන් වූවන් පිළිබඳව වූ කාර්යාලයේ අධිකාරී බලයට එරෙහිව අපහාසයක් වන වරදක් සිදු විය හැකිය. අතුරුදහන් වූවන් පිළිබඳව වූ කාර්යාලයේ අධිකාරී බලයට එරෙහිව අපහාසයක් සේ සැලකෙන නිශ්චිත අවස්ථා 24 වන වගන්තියේ දක්වා ඇති අතර එය අපරාධයක්/වරදක් ලෙස දක්වා ඇත. අතුරුදහන් වූවන් පිළිබඳව වූ කාර්යාලයට අපහාස කිරීම සම්බන්ධයෙන් විභාග පැවැත්වීම සහ දඬුවම් ලබා දීම අභියාචනාධිකරණය මගින් සිදු කෙරෙනු ඇත.